# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## භාෂා ප්‍රවීණතා විභාගය

**විශේෂ සටහන -**

**විභාග අපේක්ෂකයන්ගේ පහසුව හා මඟ පෙන්වීම පිණිස භාෂා ප්‍රවීණතා කථන හැකියා පරීක්ෂණය සඳහා වනආදර්ශ සංවාද මාතෘකාකිහිපයක් පහත දක්වා ඇත.**

## <u>II වන මට්ටම</u>

### සංවාද මාතෘකා

1. ඔබ නිවාඩු විෂය භාර නිලධාරියා යැයි සිතා රජයේ නිලධාරියෙකුට හිමි නිවාඩු සම්බන්ධව තොරතුරු විමසන නවක නිලධාරියෙකු සමඟ කරන සංවාදයක්

2. නිලධාරියෙකුට ද්විභාෂිකත්වයේ ඇති වැදගත්කම පිළිබඳ භාෂා ප්‍රවර්ධන සහකාර නිලධාරියෙකු සහ රාජ්‍ය නිලධාරියෙකු අතර සිදුවන සංවාදයක්

3. ඔබ ආයතනයට මෑතකදී මිලදී ගත් පරිගණක ක්‍රියා විරහිත වී ඇත. ඒ පිළිබඳව මිලදී ගත් ආයතනයේ නිලධාරියෙකු සහ මිලදී ගැනීම් භාර නිලධාරියා අතර සිදුවන සංවාදයක්

4. ඔබ ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරි ලෙස සිතා කාර්යාලීය ලිපි ගොනු නිවැරදිව සහ පිළිවෙලට පවත්වාගෙන යෑමේ වැදගත්කම පිළිබඳ නවක නිලධාරීයෙකු සමඟ කරන සංවාදයක්

OFFICIAL LANGUAGES DEPARTMENT

5. ඔබ ආයතනයෙන් සිදුවන සේවා පිළිබඳ සේවාලාභියෙකු සමඟ කරන සංවාදයක්

6. අඩු ආදායම්ලාභී ජනතාව නඟා සිටුවීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයන වාර්තාවක් සකස් කිරීමට ඔබට සිදුවී ඇත. ඒ පිළිබඳ ප්‍රදේශවාසියෙකු සමඟ කරන සංවාදයක්

7. ඔබ ආයතනයට රියදුරන්අලුතින් බඳවා ගැනීමට අවශ්‍යවී තිබේ. බඳවා ගැනීම් භාර නිලධාරි සමඟ කරන සංවාදයක්

8. ඔබට ආපදා ණය මුදලක් ඉක්මනින් ලබා ගැනීමට අවශ්‍යව ඇත.ඒ පිළිබඳ ණය විෂය භාර නිලධාරීයා සමඟ කරන සංවාදයක්

9. මත් උවදුරින් තරුණයන් ගලවා ගැනීම පිළිබඳව සමාජ සේවා නිලධාරියා සහ තරුණ සංවිධානයේ සභාපති අතර සිදුවන සංවාදයක්

10. ඔබගේ නව නිවාස සැලසුම අනුමත කර ගැනීමට අවශ්‍ය වී ඇත.අදාළ තාක්ෂණික නිලධාරියා සමඟ සංවාදයක්

OFFICIAL LANGUAGES DEPARTMENT